කරෙයිනගර් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 27 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 17 දින සභාවේ ලේකම් වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කරෙයිනගර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන රු. 6,390,000 ක් වටිනා පික්කප් වාහනය අයිතිය මාරු නොකර අවසන් ගිණුම්වලට ගෙනවිත් තිබීම නිසා රු. 6,390,000 ක් වටිනා මොටර් වාහනවල වටිනාකම් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සභාවේ වාහන 06 ක අයිතිය මාරු නොකර, වටිනාකම් තක්සේරු නොකර, ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මොටර් වාහනවල වටිනාකම ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඉඩම් රෙජිස්ටාර් ජනරාල් වරයාගෙන් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ලැබියයුතු මුද්දර ගාස්තු රු. 5,422,220 ක් ගිණුම්වල දක්වා නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත අරමුදල රු. 5,422,220 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
-------------------

සභාව විසින් 2015 වර්ෂය සිට 2016 වර්ෂය දක්වා ලබාදී තිබූ අත්තිකාරම් රු. 1,423,230 ක් මෙතෙක් නිරවුල් කර නොතිබුණි.

1.3.4 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
------------------------------------------------

සභාව විසින් ඉඩම් ගොඩනැගිලි ලේඛනය,මිනුම්පත්‍ර ලේඛනය,ඉඩම් විකුණුම් බදු ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.5 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම
---------------------------------------------
පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත<br>අංක 148(1) | වාහන සහ සතුන් සම්බන්ධයෙන් බදු පැනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>පරිච්ඡේදයේ II<br>රීති 32 | සභාව විසින් වරිපනම් බදු සම්බන්ධයෙන් තක්සේරුකර ලේඛනයක් පවත්වා නොතිබුනු අතර, වරිපනම් අයකිරීම් සභාව විසින් සිදු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 381(3) | චෙක්පත්වල අත්සන් කිරීම සඳහා බලය ලබා ඇති නිලධාරින් විසින් ඇප මුදල් ගෙවා නොතිබුණි. |
| (ඈ) | උතුරු පළාත් මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 107 | රු. 494,074 වටිනා ගනුදෙනු සම්බන්ධයෙන් වියදම් සත්‍යාක්ෂණය කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 5,992,332 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 4,865,497 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,126,835 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
------------------------------------
ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්ත රු. 3,191,222 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 721,570 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 2,469,652 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 31,453,460 ක්වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 28,411,441 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 3,042,019 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 20 | 8 | - |
| බදු කුලී | 1,737 | 1,735 | - |
| බලපත්‍ර ගාස්තු | 267 | 265 | - |
| වෙනත් ආදායම් | 30,464 | 27,317 | 9,650 |
| එකතුව | 32,488 | 29,325 | 9,650 |

2.4.2 වරිපනම් බදු

සභා බලප්‍රදේශයේ තිබෙන වත්කම් තක්සේරුකර නොතිබීමෙන් දේපළ මත වරිපනම් බදු මෙතෙක් අයකර නොතිබුණි.

2.4.3 වෙනත් ආදායම්

සභා බලප්‍රදේශයේ සුසාන භූමි 05 කින් සුසාන භූමි බදු අයකර නොතිබුණි.

2.4.4 මුද්දර ගාස්තු

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ලබාගත යුතු මුද්දර ගාස්තු රු. 11,689,594 ක් වාර්තා දිනය දක්වා අයකර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 45 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 37 කි. ඒ අනුව සේවකයන් 09 ක ඌණතාවයක්ද අතිරික්ත 01 ක්ද විය.

(ආ) සභාවේ ක්‍රියාකාරකම් කාර්‍යක්ෂමතාව පවත්වා ගෙන යාම සඳහා වාර්ෂිකව විගණන කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රුැස්වීම් 03 ක් පමණක් සභාව විසින් පවත්වා තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්
------------------------------

සභාවේ තිබෙන ට්‍රැක්ටර් රථය, යතුරු පැදිය, රෝණියෝ යන්ත්‍ර නිෂ්ක්‍රියව තිබුණි.

3.3 අපද්‍රව්‍ය කළමනාකරණ
-------------------------

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමෙන් තොරව එකට ගොඩ ගසා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

වියදම් ව්‍යුහය
---------------

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 1,169 සිට රු. 3,108,127 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.